**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ එහි පරිපාලිතයන් - 2023**

**------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ (“කාර්යාංශය”) සහ එහි පරිපාලිතයන්ගේ (“සමූහය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල කාර්යාංශයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ හා සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය හා සමූහය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

### 1.5.1.1 ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 106 සිට 115 දක්වා වූ ඡේද ප්‍රකාරව සමූහයේ සහ කාර්යාංශයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මුහුණතෙහි දක්වා ඇති අයිතමයන්ට අදාල විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාල සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අයිතමයන් සඳහා විස්තරාත්මක සටහන් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාර්යාංශයේ නව විද්‍යාගාර ගොඩනැගිල්ල හා කුරුණෑගල කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් අවසන්ව ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ඊට අදාළ පිළිවෙලින් රු.421,620,219 ක් හා රු.7,820,949 ක් වූ පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. එහිදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 69 ඡේදය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂයට අදාළ ගොඩනැගිලි ක්ෂය රු.21,472,058 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අදාල ගැලපීම සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් සහ ක්ෂය කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | "පශ්චාත් සේවා ප්‍රතිලාභ" ලෙස 2023 දෙසැම්බර් 31 දිනට රු.328,203,924 ක ශේෂයන් දක්වා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදය ප්‍රකාරව සේවකයන් උපයාගත් ප්‍රතිලාභවල වටිනාකම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කිරීමට ආයුගණක ශිල්පක්‍රම භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | පාරිතෝෂිත ගෙවීම සඳහා වෙන්කිරීම නිවැරදි ලෙස සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයුගණක ශිල්පක්‍රම භාවිතා කළ යුතුය. |

**1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භූමි පුනරුත්ථාපනය සඳහා බලපත්‍රලාභීන් වෙතින් ලබා ගනු ලැබූ රු.463,177,325 ක් වූ බැංකු ඇපකර කල් ඉකුත් වීමෙන් පසු මුදල් කරගෙන ස්ථාවර තැන්පතුවල හා ජංගම ගිණුම්වල තැන්පත් කර තිබුණි. එම වටිනාකම නියෝජනය කරනු ලබන ඉඩම් පුනරුත්ථාපන අරමුදල් ගිණුමේ ශේෂය රු.383,426,675 ක් වූයෙන් රු.79,750,650 ක වෙනසක් පැවතුණි. | මෙම වෙනසට හේතුව වනුයේ පුනරුත්තාපන බැඳුම්කර ගිණුමේ පොළිය සහ ප්‍රවර්ථන වර්ෂයේ පුනරුත්තාපන බැඳුම්කර ශේෂයන්ගෙන් අයකර ගනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු ආදී ආදායම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු අදාල ගිණුමට බැර කර ඇති අතර, අනෙකුත් අදාල බදු ඒ ඒ ගිණුම් වලට බැර කිරීමට කටයුතු කර ඇත. | ඉඩම් පුනරුත්ථාපන අරමුදල් නිදහස් කිරීමෙන් ලද මුදල් නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වැලි, පස් හා බොරළු සඳහා දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේදී රැස් කරගත් රු.26,495,395 ක ආදායම, ආදායමක් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට අවිනිශ්චිත ශේෂයක් ලෙස දක්වා තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වැලි පස් හා බොරළු සඳහා නිකුත් කරනු ලැබූ ප්‍රමාණ බලපත්‍ර වෙනුවෙන් අදාල මුදල ගිණුම් ගත විය යුතු බවය. | ප්‍රවාහන බලපත්‍ර ආදායම් නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ ජනවාරි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගනුදෙනුකරුවන් විසින් සෘජුවම කාර්යාංශයේ බැංකු ගිණුමට බැර කර තිබූ රු.17,516,623 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගණුදෙනුකරුවන් විසින් කාර්යාංශයේ බැංකු ගිණුමට තැන්පත් කරනු ලබන මුදල් (Direct Deposit) වශයෙන් ගෙවිය යුතු ගිණුමක දක්වා ඇත්තේ අදාල බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගණුදෙනු කරුවන් හඳුනා ගෙන ලදුපත් නිකුත් කරන තෙක් පමණක් වන අතර, මෙම සෘජු තැන්පත් පිළිබඳව අදාල අංශ විසින් එම ගෙවීම් කරනු ලබන්නේ කුමක් නිසාද යන්න ඉදිරියේදී මූල්‍ය අංශය දැනුවත් කරනු ලබයි. | සෘජු බැර කිරීම් හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ශුද්ධ අගය රු.13,680,042 ක් වූ මෝටර් රථ වාහන සමාලෝචිත වර්ෂයේදී රු.418,125,000 කට ප්‍රත්‍යාගණනය කිරීමේදී ජනිත වූ රු.404,444,958 ක ප්‍රත්‍යාගණන අතිරික්තය රු.418,125,000 ක් ලෙස ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කර ආදායමින් අඩුකර දැක්වීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිතය රු.13,680,042 ක් වැඩියෙන් හා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.1.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වෙනත් ගෙවිය යුතු අත්තිකාරම් යටතේ දක්වා තිබූ ප්‍රවාහන, කැණීම් හා ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලබාගෙන තිබූ රු.194,454,748 ක අත්තිකාරම් සඳහා විස්තරාත්මක උපලේඛනයක් හා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් නිවැරදිභාවය තහවුරු නොවීය. | 194,454,748 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ | කාර්යාංශය බලපත්‍ර නිකුත්කිරීමට පෙර බලපත්‍රලාභීන් බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන පළමු අවස්ථාවේම බලපත්‍රයේ ගාස්තුව අත්තිකාරම් වශයෙන් ලබාගැනීම අනුගමනය කරනු ලබන ක්‍රමවේදය වේ. බලපත්‍රය නිකුත් කල පසු මෙම මුදල් අත්තිකාරම් ගිණුමෙන් ආදායම් ගිණුමට මාරු කරනු ලබයි. එතෙක් මෙම මුදල් ගෙවිය යුතු අත්තිකාරම් වශයෙන් ගිණුම් ගත කර තබා ගනී. මේ සඳහා 2023 වර්ෂයේ සිට කාල විශ්ලේෂණයක් ලබාදී ඇත.පෙර වර්ෂ සඳහා ලිපිගොනු පරික්ෂා කර සත්‍ය වශයෙන් ගෙවිය යුතු ගිණුම්වල පවත්වාගත යුතු අත්තිකාරම් මුදල මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම සඳහා අදාල අංශය දැනුවත් කර ඇත. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ජී එස් එම් බී තාක්ෂණ සේවා (පුද්) සමාගම

#### 1.5.2.1 ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 17 හි19 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 90,853,735 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 1,109 ක් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කම්වල ඵලදායි ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් ප්‍රමිතියට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ දී අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගනනය කලයුතු බැවින් ඒ සඳහා යන මූල්‍ය පිරිවැය, කාලය හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම තුළ ආයතනයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සලකා බලා නොමැත, වත්කමෙහි ධාරණ අගය හා සාධාරණ අගය අතර ප්‍රමාණාත්මක වෙනසක් නොපවතින බවට උපකල්පනය කර ඇත,වර්තමානයේ ගිණුම්කරණ ප්‍රමිත සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදු නොකරන බව (2018/12/31/ දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇත.<br>මේ පිළිබඳ ගිණුම්කරණ ප්‍රමිත අංක 3.07.d හි පැහැදිලි කිරීමක් දැනටමත් සිදුකර ඇති අතර ගිණුම් සටහන් | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල සාධාරණ වටිනාකම දැක්වීම කළ යුතුය. |

අංක 12.3 ඔස්සේ තවදුරටත් හෙළිදරව් කිරීමක් සිදු කරීමට අපේක්ෂා කරනු ඇත.

**1.5.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මනම්පිටිය වැලි ව්‍යාපෘතියේ රාජ්‍යභාග හා බලපත්‍ර ගාස්තු වියදම රු.86,352,396 ක් වුවද එම වියදම රු.78,072,349 ක් ලෙස රු.8,280,047 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම නිසා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබ විසින් යොමු කරන ලද විගණන විමසුමෙහි මනම්පිටිය ව්‍යාපෘතිය පාදක කරගෙන රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තුව ගණනය කර ඇත. නමුත් මූල්‍ය ප්‍රකාශනවල වියදම ලෙස දක්වා ඇති ශේෂය පහත පරිදි සාරාංශ කළ හැකිය.<br>අපගේ මූල්‍ය ප්‍රකාශනවල මනම්පිටියට අදාල වියදම රු.76,659,980 ක් වේ. මෙහි වෙනස රු.9,692,416 ක් වන අතර එයට හේතුව 2022 වර්ෂයට අදාලව අප විසින් වෙන් කර ඇති අධිවෙන් කිරීම ගැලපීමයි. | කැණීම් කරන ලද ප්‍රමාණය පදනම් කරගෙන නිවැරදිව රාජ්‍යභාග ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2022 ජූලි 10 දින සිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට වැලි තොගයක් නොමැති වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.10,603,916 ක වැලි තොග වටිනාකමක් දක්වා තිබුණි. ඒ හේතුවෙන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම තොග ඌණතාවය සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය පිළිබඳ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ අප සමාගමේ ප්‍රධාන විධායක නිළධාරීතුමා විසින් පත් කරන සමාගමේ විවිධ අංශවල නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් 2023 වර්ෂයේ දී විශේෂ විමර්ශණයක් සිදු කර ඇත. එම විමර්ශණ වාර්තාව සභාපතිතුමා, ප්‍රධාන විධායක නිළධාරීතුමා, විගණන හා කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර එමඟින් ලැබෙන නිර්දේශ හා උපදෙස් මත පදනම්ව ඉදිරියේ දී තොග ඌණතාවයන් සම්බන්ධව ගැලපීම් සිදු කිරීමට සහ ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තුවේ. | තොග භෞතිකව සත්‍යාපනය කර තොගවල නිරවද්‍යතාවය තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතුය. තොග ඌණතාවය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව වහාම ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශයේ පරිපාලිත සමාගම වූ ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ කාර්යාංශයෙන් සමාගමට ලැබිය යුතු ශේෂයක් ලෙස සමාගම වැඩිපුර ගෙවූ රු.5,794,943 ක රාජ්‍යභාග වියදමක් හඳුනාගෙන තිබුණද, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ අදාල ශේෂය ගෙවිය යුතු වටිනාකමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර පරීක්ෂාවන් වෙනුවෙන් කාර්යාංශය වෙත ගෙවිය යුතු රු.1,487,602 ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන තිබුණද කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවන ලද රාජ්‍ය භාගය 2023 වර්ෂයේ අයවැය කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු රාජ්‍ය භාග සඳහා හිලව් කිරීම සිදුකර ඇත.<br>පරිපාලතය විසින් හඳුනාගෙනතිබූ නමුදු කාර්යාංශය වෙත නොදන්වා ගෙවිය යුතු ශේෂය රු.1,487,602 කි. මෙය පරිපාලිතය විසින් කාර්යාංශය වෙත දැනුම් දී නොමැත. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පියවීම කළ යුතුය. |
| (ආ) | 2009-2022 කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.2,031,643 ක් වූ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන තුරු කටයුතු කර නොතිබුණි. | මෙම තොරතුරු පැරණි ලිපිගොනු වලින් සොයා නිරවුල් කළ යුතුව ඇති බැවින් ඉදිරි දින 14 තුළ දී අදාළ පැහැදිලි කිරීම් ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පියවීම කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත | | | |
| | (i) 12(ඉ) වගන්තිය | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි. | ඛනිජ සඳහා අගය එකතු කිරීමේ නිර්නායක, ඇතුළත් වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත.කාර්යාංශය කර්තව්‍යයන් ඉටුකිරීමේදී ජනනය වන දත්ත සිතියම් වාර්තා සහ වාර්ෂික ඛනිජ වාර්තාව (Mineral Year Book) මගින් ප්‍රචලිත කර ඇත. තවද මෙම තොරතුරු කාර්යාංශයේ පුස්තකාලයෙන් පරිශීලනය සඳහා ලබාගත හැක. | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර හඳුන්වාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 28(1) වගන්තිය | කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 (4) ප්‍රකාරව යම් ඛනිජ ද්‍රව්‍යක් ප්‍රවාහනයට බලපත්‍රයක් ලබා ගත යුතුය. නමුත් කළුගල් නිෂ්පාදන (කැඩීම) ක්‍රියාවලිය ගැන සැලකීමේදී එම කටයුතු නියාමනය කිරීම දැනට පවතින ක්‍රමවේදයට අනුව පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සහ 2009 අංක 66 සංශෝධිත පනත ප්‍රකාරව කැණීම් බලපත්‍රය පරිසර පනතට අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින්ද,පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සහ පුපුරණ ද්‍රව්‍ය පනත ප්‍රකාරව නිකුත් කරනු ලබන පුපුරණ ද්‍රව්‍ය භාවිතය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය ඇතුළුව බලපත්‍ර 03 ක් මගින් සිදුවේ.ඛනිජ වල ස්ථාවර මිළක් පවත්වා ගෙන යාම කාර්යාංශයට විශාල වගකීමක් පැවරෙන අතර, නියාමනයට ගන්නා වූ මෙම ක්‍රියාමාර්ගය ඒ පිළිබඳව සියළු කරුනු අධ්‍යනය කර කළුගල් සඳහා ප්‍රවාහන බලපත්‍ර නිකුත් නොකිරීමට කාර්යාංශය දැනට තීරණය කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) 52(2) වගන්තිය | කැණීම් වලින් අනතුරුව කැණීම් භූමි පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු අතර කැණීම් බලපත්‍රලාභීන් 1,918 ක් ලවා භූමි පුනරුත්ථාපන කටයුතු සිදුකර ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි. | කැණීම් වලින් අනතුරුව කැණීම් භූමි පුනරුත්තාපන කටයුතු මේ වනවිට කාර්යාංශයේ පතල් සුරක්ෂිතතා අංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකරමින් පවතී. | කැණීම් භූමි පුනරුත්ථාපන ය කළ යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති රජය සතු ව්‍යාපාර සඳහා වූ, | | | |
| (i) ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2.5 වගන්තිය | කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී පරිපාලිත සමාගමේ ක්‍රියාකාරීත්වය නිතිපතා සමාලෝචනය කිරීම, කාර්යාංශයට බලපෑමක් ඇති | විගණනය දක්වා ඇති කරුණු වලට එකඟ වන අතර, ඉදිරියේදී ඒ අනුව කටයුතු කරනු ලැබේ. | පරිපාලිතයේ කටයුතු සමාලෝචනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවදානම් සහ අනෙකුත් ගැටලු පිළිබඳව දැනුවත් වීම, අන්තර් සමාගම් ගනුදෙනු සමීපව නිරීක්ෂණය කිරීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ii) ආයතනික පාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රේගු අමාත්‍යාංශය වෙත හෝ අනෙකුත් ආයතන වෙත කාර්ය මණ්ඩලය මුදා හැරීම හා මුදා හරින ලද සේවකයන් සඳහා මුදා හරින ලද කාලපරිච්ඡේදය තුළ වැටුප් ගෙවීම සිදු නොකළ යුතු නමුත් ජනාධිපති කාර්යාලය වෙත අනුයුක්ත කරන ලද ලේඛකාධිකාරීවරයෙකුට 2023 පෙබරවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් ලෙස රු.963,600 ක් ගෙවා තිබුණි. | විගණනය දක්වා ඇති කරුණු වලට එකඟ වන අතර, ඉදිරියේදී ඒ අනුව කටයුතු කරනු ලැබේ. | වෙනත් ආයතන වලට කාර්ය මණ්ඩලය මුදා හැරීම නොකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,159,672,376 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.1,969,642,374 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.809,969,998 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ආදායම රු.393,742,056 කින් වැඩි වුවද ආදායම රු.1,454,882,583 කින් අඩුවීම හා පරිපාලන වියදම් රු.137,675,495 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ රු.1,500,256 ක් වැය කර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර තිබූ ඉන්ධන ටැංකිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ඉන්ධන ටැංකිය විකිණීම සඳහා මේ වන විට කළමණාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන ඇති අතර මිල ගණන් කැඳවීමෙන් පසු ලැබෙන මිල ගණන් සළකා එය ආර්ථික වශයෙන් කොතරම් ලාභදායී ද යන්න පිරිවැය වාසි විශ්ලේෂණයක් සිදු කර මේ පිළිබඳ අවසන් තීරණයක් ගැනීමට කටයුතු කරමින් පවතී. | ඉන්ධන ටැංකිය ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමේදී උපදේශන සේවා ලබා ගැනීමට සහ ලංසු ලේඛන පිළියෙල කිරීමට වරලත් ඉංජිනේරුවරයකුගේ සේවය ලබා ගෙන 2023 දෙසැම්බර් 31 | කාර්යාංශය සතු ඉඩම් වල විවිධ වූ සංවර්ධන කටයුතු වලදී තාක්ෂණික උපදෙස් සඳහා ව්‍යාපෘති පදනම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ රාජ්‍ය සේවයේ නිරතව සිටි වරලත් සිවිල් ඉංජිනේරුවරයකුගේ සේවය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳ |

| | | |
|---|---|---|
| දින දක්වා රු.2,105,200 ක් ගෙවා තිබුණි. මීට අමතරව උක්ත වරලත් ඉංජිනේරුවරයා ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා ලෙස ද පත් කර තිබුණු අතර ඒ තුළින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී බැඳියාවන් අතර ගැටුමක් (Conflict of Interest) ඇතිවී තිබුණි. ඉදිකිරීම් සඳහා 2022 අප්‍රේල් 01 දින දක්වා අතුරු ගෙවීම් 4 ක් මගින් රු.19,253,840 ක් එනම්, කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 23 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද සිදුකළ කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය පිළිබඳව ඇගයීමක් සිදුකරද නොතිබුණි. මෙම ඉදිකිරීම වසර 2 කට ආසන්න කාලයක සිට නවතා තිබීම හේතුවෙන් ගොඩනැගිල්ල පරිහරණය කිරීමට නොහැකි වී තිබුණි. | ලබා ගන්නා ලදී. පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමේ දී අඩු උපදේශන ගාස්තුවකින්, ඉහත සිවිල් ඉංජිනේරුවරයා හරහා උපදේශන සේවය ලබා ගන්නා ලදී. තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු ලෙස අදාළ ඉංජිනේරුවරයා පත් කර ගන්නා ලදී.<br>අදාළ ලංසු කැඳවීමට අනුව ආයතන 14 ක් ලංසු ඉදිරිපත් කර තිබූ අතර ස්වාධීන තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අවම මිල ඉදිරිපත් කර තිබූ අර්ධ රාජ්‍ය ආයතනයක් වන Central Engineering Services (Pvt.) Ltd තෝරා ගැනීමට කටයුතු කර ඇත. එම අවස්ථාවේ දී තාක්ෂණික දැනුම සහිත සිවිල් ඉංජිනේරුවරයාගේ සහය ද තාක්ෂණික ඇගයීම් කමිටුවට ලබාගත් අතර ප්‍රසම්පාදන කටයුතු ස්වාධීනව සිදු නොවූ බවට සිද්ධියක් නිරීක්ෂණය නොවේ.<br>මෙතෙක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති සියළු ගෙවීම් සිදුකළ වැඩ සඳහා සිදු කරන ලද ගෙවීම් භෞතික ප්‍රගතිය විශ්ලේෂණය කර පැරණි කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගෙවීම් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. එතෙක් පැරණි කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන ඇපකරය දිර්ඝ කරමින් ඔහු කාර්යාංශ පාලනය යටතේ රඳවා ගැනීමට කටයුතු කර ඇත.<br>නව උපදේශකගේ මඟපෙන්වීම යටතේ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බැවින් මෙතෙක් දරා ඇති වියදම් නිශ්කාර්ය නොවන බව දන්වමි. | නැවත පරික්ෂා කරීමත්,ඉදිකල ගොඩනැගිල්ල පරිහරණයටත් ගත යුතුය. |

**3.2** **කළමනාකරණය අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.513,490,321 ක් වූ ණය ගැති ශේෂය තුළ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පවතින ශේෂ වල එකතුව රු.3,207,738 ක් වූ අතර විගණිත දිනය වන විටත් මෙම ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය ගැතියන් අසාදු ලේඛණගත කර ඇති අතර, කළමණාකරන මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම තිරණය මත ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018-2021 කාලපරිච්ඡේදය තුළ කාර්යාංශය විසින් වැඩිපුර ගෙවූ විධායක නිලධාරීන්ගේ ජංගම දුරකථන බිල්පත් රු.3,886,701 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව මේ වනවිට අදාල අංශ දැනුවත් කර ඇති අතර, එම වියදම් සඳහා අවශ්‍ය අනුමැතින් පවතීනම් එම වියදම් කපා හැරීමටත් එසේ නොමැති නම්, අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කරනු ලැබේ. | අදාල නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම සඳහා 2022 වර්ෂයේ වැයකරන ලද රු.1,661,910 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබූ අතර 2023 පෙබරවාරි 20 දින උක්ත කාර්ය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබීමෙන් මෙකී වියදම නිෂ්කාර්ය වී තිබුණි. එසේ වුවද කාර්යාංශය විසින් යෝජිත ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රු.20,394,000 කට පරිගණක 60 ක් 2023 පෙබරවාරි 21 වන දින මිලදී ගෙන තිබුණි. විගණිත දින වූ 2024 මාර්තු 15 වන විට මින් රු.4,078,800 ක් වටිනා පරිගණක යන්ත්‍ර 12 ක් නිෂ්කාර්යව ගබඩාව තුළ රඳවා තබා තිබුණි. | කාර්යාංශය සඳහා ව්‍යවසාය සම්පත් සැළසුම් පද්ධතියක් (ERP) ස්ථාපනය කිරීම සඳහා 2022 වර්ෂයේ දී අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. 2023 වර්ෂයේ දී තාවකාලිකව අත්හිටවූ එම ප්‍රසම්පාදන කටයුතු මේ වන විට පෙර උපදේශකගේ උපදේශකත්වය යටතේම ආරම්භ කර EOI අවධිය අවසන් කර ඇත. පද්ධති ස්ථාපනය කිරීමට අදාළව මිල දී ගනු ලැබූ පරිඝණක සියල්ලම මේ වන විට ප්‍රාදේශීය කාර්යාල වෙත ලබා දී ඇත. ඉදිරියේ දී පද්ධතිය ස්ථාපනයේ දී මෙම පරිඝනක ඒ සඳහා යොදා ගන්නා අතර, එතෙක් මහජන සේවා කඩිනම් කිරීමට අවශ්‍ය බලපත්‍ර ලබා දීම එම පරිඝනක යොදා ගනු ලබයි. | වත්කම් නිසි පරිදි උපයෝජනය කළ යුතුය. |
| (ඈ) | ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සමාගම වෙත ඛණිජ ගවේෂණය සඳහා නිකුත් කර තිබූ අංක EL/406 දරන ගවේෂණ බලපත්‍රයේ වළංගු කාලය 2022 දෙසැම්බර් 30 දිනෙන් අවසන්ව තිබුණු අතර 2023 ජනවාරි 04 දිනැති අංක 2013/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 14(ඉ) වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභීන් ගවේෂණය අවසන් කළ දින සිට හෝ බලපත්‍ර වළංගු කාලය ඉකුත් වූ දින සිට වසර දෙකක කාලයක් තුළ කැණීම් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට හෝ අදාල ගාස්තු ගෙවා විභව ප්‍රදේශය තමා වෙත රඳවා ගැනීම සඳහා අවස්ථාව ලබාදී තිබුණි. අදාල ගවේෂණ ප්‍රදේශය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීම සඳහා එම සමාගම වෙත සති 2 ක කාලයක් ලබාදී තිබුණි. එසේ තිබියදී ගවේෂණ බලපත්‍රයෙහි ඇතුළත් ග්‍රිඩ් 07 ක භූමි ප්‍රදේශයක් 2023 ඔක්තෝබර් 09 දින සිට 2025 ඔක්තෝබර් 08 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගවේෂණ කටයුතු කිරීමට වෙනත් පුද්ගලික සමාගමක් වෙත අංක EL/434 දරන ගවේෂණ බලපත්‍රය නිකුත් කර තිබුණි. | කාර්යාංශය විසින් ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත ගවේෂණ බලපත්‍ර ලබාදීම 2022 දෙසැම්බර් 30 දිනෙන් අවසන් වන පරිදි වරින් වර දීර්ඝ කිරීම් සිදුකරමින් වසර 10කට ආසන්න කාලයක් සඳහා නිකුත් කර ඇත. මෙහිදී වෙන්කරනු ලැබූ ප්‍රදේශයේ කිසිදු ගවේෂණයක් වාර්තා හෝ ප්‍රගතියක් ඉදිරිපත් කර නොමැති බැවින්, ගවේෂණ බලපත්‍රවල වලංගු කාලය 2022 දෙසැම්බර් මස 30 දිනෙන් අවසන් වුවද කර්මාන්ත අමාත්‍යාංශය හා පරිසර අමාත්‍යාංශය විසින් ගනු ලැබූ තීරණ පරිදි බලපත්‍ර අවසන් වූ දින සිට මාස 6ක් ඇතුළත ගවේෂණ ප්‍රදේශයේ ඉඩම් අයිතිය ලබාගැනීම ඇතිළු අනෙකුත් අවශ්‍යතා ලබා දෙන ලෙස දැනුම් දී ඇත.<br>එම එකගතාවයට අනුව ලංකා මිනරල් සෑන්ඩ් ආයතනය අදාල වාර්තා මේ වන තෙක් සම්පූර්ණ කර නොමැති අතර, ගවේෂණ ප්‍රදේශය වෙන්කර ගැනීම සඳහා ලියාපදංචි තැපැල් මගින් විටින් විට චෙක්පත් එවා ඇත. ඒ අනුව අදාල ගෙවිය යුතු ගාස්තු හා ලබාදිය යුතු විස්තර ඇතුළත් වාර්තා ලබාදෙන ලෙසත් දන්වමින් කාර්යාංශය ආපසු ලිපි මගින් දැනුම් දී ඇත.<br>කාර්යාංශයට එම අසම්පූර්ණ ගාස්තු සහ ලේඛණ වෙනුවෙන් මුදල් අයකර ගැනීම පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත හා රෙගුලාසි ප්‍රකාරව සිදුකළ නොහැක. බලපත්‍ර ලබාගෙන කිසිදු ගවේශණයක් හෝ කැණීම් කිරීම සඳහා හෝ කටයුතු නොකිරීම කාර්යාංශයට ගැටළුවක් වූ බැවින්, ඒ පිළිබඳව කර්මාන්ත අමාත්‍යාංශය හා පරිසර අමාත්‍යාංශය විසින් ගනු ලැබූ තීරණ අනුව අදාල කටයුතු සිදුකර ඇත. ලංකා මිනරල් සෑන්ඩ් ආයතනය වෙත ලබාදී තිබූ එක් ගවේශණ බලපත්‍ර ප්‍රදේශයක් සඳහා EX/434 අංක දරණ ගවේශණ බලපත්‍රය පුද්ගලික | ගවේෂණ බලපත්‍ර වළංගු කාලය දීර්ඝ කිරීමට ඉඩ සලසා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආයතනයකට ලබා දී ඇත. එම ආයතනය ගවේෂණ කටයුතු සිදුකිරීමේදී, එම ප්‍රදේශය වනජීවී කලාපයට අයත් වන බව අනාවරණය විය. ඒ අනුව වර්තමානය වන විට එම ගවේශණ බලපත්‍රයද ක්‍රියාවේ යෙදවිය නොහැකි තත්ත්වයක් පවතී. එම ප්‍රදේශය ලංකා මිනරල් සැන්ඩ් ආයතනය වෙත ලබා ගත්තද ගවේශණ කටයුතු ක්‍රියාත්මක කළේ නම්, එම ආයතනයටද මෙම තත්ත්වයම උදාවන බව බැවින්, එම ප්‍රදේශය සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැකි බව දැක්වේ. | |
| (ඉ) | ඉහළ ඇළහැර උමං ඇළ මාර්ගයේ 4 වන උමඟ (Tunnel 4) කැණීම් කිරීමට කාර්යාංශය විසින් ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතියට නිකුත් කර තිබුණු අංක IML/A/HO/N/15134/LR/2 දරන කැණීම් බලපත්‍රය භාවිතයෙන් තුන්වන උමං මාර්ගයේ (Tunnel 3) කි.මීටර 5.77 ක දුරක් කැණීම් කර තිබුණද ඒ සම්බන්ධයෙන් කාර්යාංශය නිසි නියාමනයක් සිදුකර නොතිබුණි. | පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව මඟින් සියළුම ක්ෂේත්‍ර ආවරණය කරමින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව කාර්යාංශය මඟින් ජාතික මට්ටමේ වැඩසටහන් ලෙස සළකා මෙම කැණීම් බලපත්‍රය නිකුත් කර ඇත. කවද උක්ත පනත හා රෙගුලාසි යටතේ පවතින නීතිමය ප්‍රතිපාදක අනුව මහා පරිමාණ “IML/A” කාණ්ඩයේ ව්‍යාපෘති සඳහා කැණීම් කටයුතු ආරක්ෂාකාරී ලෙස සිදු කිරීම සඳහා යොදාගනු ලබන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව සීමා කිරීමක් සිදු කළ නොහැක. | අවශ්‍ය නියාමනයන් සිදුකළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකාව තුළ පොස්පේට් ඛනිජය සඳහා කාර්යාංශය විසින් සමීක්ෂණයක්, සිදුකරන තෙක් පොස්පේට් ඛනිජය සඳහා කිසිදු ගිවිසුමකට එළඹීම 2000 ජූනි 02 දිනැති අංක SE(FR)884-99 දරන බුලන්කුලම එදිරිව ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය හා වෙනත් අය යන නඩුව මගින් නීති විරෝධී බව තීරණය වී තිබුණි. මීට අමතරව ජාතික විද්‍යා සභාවේ සහ ජාතික විද්‍යා පදනමේ උපදේශනය මත කාර්යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ ඇපටයිට් සහ අනෙකුත් පොස්පේට් ඛනිජ සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක් සිදුකර වාර්තාවක් පලකළ යුතු බවත්, දැනුම් දී තිබුණි. ඒ අනුව වර්ෂ 22 කට පසු කාර්යාංශය විසින් එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධයෙන් සිදුකරන ලද සමීක්ෂණයේ වාර්තාව ජාතික විද්‍යා පදනමේ හා ජාතික විද්‍යා ඇකඩමියේ නිර්දේශයන් ලබා ගැනීමට පෙර 2023 ජූනි 21 වන දින කාර්යාංශයේ නිල වෙබ් පිටුව හරහා සහ පුවත්පත් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. 2023 අගෝස්තු 25 වන දින ජාතික විද්‍යා පදනම විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව මගින් අධිකරණය නියෝග කළ කාර්ය නිසි පරිදි ඉටු කිරීමට කාර්යාංශය අපොහොසත් වී ඇති බව දන්වා තිබු අතර සමීක්ෂණ වාර්තාව සඳහා ජාතික | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ප්‍රකාශයට පත්කරන ලද එප්පාවල පොස්පේට් පිළිබඳ වාර්තාව ජාතික විද්‍යා පදනමේ හා ජාතික විද්‍යා ඇකඩමියේ අනුමැතියට යටත්ව නීතිපතිගේ උපදෙස් අනුව ප්‍රකාශයට පත්කරන ලදී. මෙහි සඳහන් “නව” නිර්දේශයන් පිළිබඳව වාර්තාව ප්‍රකාශයට පත්කරන ලද අවස්ථාවේ දී කිසිදු සඳහනක් අදාල ආයතන විසින් ඉදිරිපත් නොකරන ලදී.<br>කාර්යාංශය විසින් සිදුකර ඇති සමීක්ෂණය, එහි ව්‍යාපෘතිය හා ඒ සඳහා පාදක වූ ප්‍රායෝගික තත්ත්වය එම වාර්තාවේ පැහැදිළිව දක්වා ඇත. නිවැරදි නිගමනයක් ලෙස අදාල අධිකාරීන් විසින් තහවුරු කරනු ලබන්නේ නම් අධිකරණ තීන්දුවට අදාලව මෙම සමීක්ෂණය සිදුකල යුතු ක්‍රමවේදය කාර්යාංශය වෙත දන්වා එවන මෙන් ඉල්ලීම් සිදුකර ඇත.<br>ජාතික විද්‍යා පදනමේ අනුමැතිය සහිතව වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත. අපනයන බලපත්‍ර ලබාදීම හා වාර්තාව ප්‍රකාශයට පත්කිරීම අතර සම්බන්ධයක් පවතින බවට ඛනිජ අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම වෙන්ව සළකා බලන බවක් පැහැදිලිවේ. කාර්යාංශය විසින් අපනයනකරුවන් තෝරා ගැනීමේදී විවෘත ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළයුතු බව කර්මාන්ත අමාත්‍යාංශයට දන්වා සිටින ලදී. | අපනයනය බලපත්‍ර ලබාදීම නීතිමය විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විද්‍යා පදනමේ අනුමැතිය ලබාදී නොතිබුණි. නඩු තීන්දුව අනුව ජාතික විද්‍යා පදනමේ එකඟතාව ලබාදීමෙන් පසු සමීක්ෂණ වාර්තාව ප්‍රසිද්ධියට පත් කිරීම හා අපනයන බලපත්‍ර ලබාදීම කාර්යාංශය විසින් සිදුකළයුතු වුවද ඊට පටහැනිව ලංකා පොස්පේට් සමාගම විසින් තෝරා ගත් පොස්පේට් අපනයනකරුවන් වෙත කාර්යාංශය විසින් අපනයන බලපත්‍ර ලබාදී තිබූ අතර පෞද්ගලික අපනයනකරුවන් දෙදෙනෙකු විසින් මෙට්‍රික් ටොන් 7500 ක් හා 2350 ක් අපනයනය කරද තිබුණි. | අපනයන කරුවන් තෝරාගැනීම කර්මාන්ත අමාත්‍යාංශයේ වගකීම බවට තීරණය කර තිබුණි. | |
| (උ) | නීති විරෝධී ලෙස සිදු වන ඛනිජ කැණීම්, සකස් කිරීම්, වෙළඳාම් කිරීම් වැටලීමේ අරමුණින් බලගැන්වීමේ ඒකකයක් ස්ථාපිත කර තිබුණද අනුමත බලගැන්වීමේ නිලධාරී තනතුරු 06 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විට තනතුරු 3 ක් පුරප්පාඩුව පැවතුණි. මේ හේතුවෙන් 2021 වර්ෂයේ 184 ක් ව පැවති අතීත කැණීම් භූමි පරීක්ෂා කිරීම 2023 වර්ෂයේ 57 දක්වා අඩු වී තිබූ අතර 2021 වර්ෂයේ 835 ක් වූ පැමිණිලි පරීක්ෂා කිරීම් 2023 වර්ෂයේ 204 ක් දක්වා අඩුවී තිබුණි. | මේ වනවිට අනුමත බලගැන්වීමේ නිලධාරී තනතුරු බඳවා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | බලගැන්වීමේ ඒකකය ක්‍රියාත්මක කල යුතුය. |
| (ඌ) | කාර්යාංශයේ කැණීම් අංශය සහ ගිණුම් අංශය භාවිතා කරන පරිගණක මෘදුකාංග පද්ධතීන් වසර 20 කට වඩා පැරණි වන අතර වාර්ෂිකව රු.1,050,000 ක නඩත්තු වියදමක් පෞද්ගලික සමාගමකට ගෙවමින් භාවිතා කරනු ලැබුවද, කාර්යාංශයේ වර්තමාන මෙහෙයුම් හා මූල්‍ය අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට කැණීම් අංශයට අදාළ බලපත්‍ර නිකුත් කිරීම, රාජ්‍ය භාග ගණනය කිරීම ඉන්වොයිසි නිකුත් කිරීම , ගාස්තු අයකිරීම ,බැංකු ඇපකර ලබා ගැනීම, කැණීම් භූමි පුනරුත්ථාපනය, කැණීම් බලපත්‍ර අවලංගු කිරීම, ගාස්තු ආපසු ගෙවීම යනාදිය හා ගිණුම් අංශයට අදාළ හා පහසුකම් ඇතුළත්ව යාවත්කාලීන කර නොතිබුණි. | මෙම මෘදුකාංග පද්ධතිය සම්බන්ධව අවශ්‍ය යාවත්කාලීන කටයුතු කිරීම වියදම් අධික බැවින් කාර්යාංශය මේ වනවිට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතී. තවද මෙම මෘදුකාංග පද්ධතිය සඳහා ගෙවන ලද මුදල වන රු. 1050,000 ක මුදල, කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 21 සමඟ පවතින එදිනෙදා කටයුතු කරගෙන යාම සඳහා වාර්ෂිකව ගෙවන ලද නඩත්තු වියදම වේ. | මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කල යුතුය. |
| (එ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 52(2) වගන්තිය ප්‍රකාරව කැණීම් වලින් අනතුරුව භූමිය පුනරුත්ථාපනය කළ යුතු වුවද කළුගල් සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී, කාර්යාංශය විසින් කැණීම්කරු වෙතින් ලබාගත් ආර්ථික ජීව්‍යතා වාර්තාවල “කළුගල් කැණීම් කිරීමෙන් අනතුරුව බිම් මට්ටම අවට තැනිතලාවල සාමාන්‍ය බිම් මට්ටමට වඩා ඉහළ මට්ටමක | කැණීම් භූමි පුනරුත්තාපනය සම්බන්ධයෙන් බැංකු ඇපකරයක් සහ විධිමත් පුනරුත්තාපන සැළැස්මක් සහිත නීතිමය ගිවිසුමක් කාර්යාංශය සහ බලපත්‍රලාභියා සමඟ ගිවිස ගන්නා අතර, එම ගිවිසුම අනුව කැණීම් භූමිය පුනරුත්තාපනය නොකරන්නේ නම් බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය හා ගිවිසුමට අනුව කටයුතු නොකිරීම මත අදාල නීතිමය කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කැණීම් භූමි පුනරුත්ථාපනය කළ යුතුය. |

පවතින බැවින් ගොඩකිරීමේ අවශ්‍යතාවයක් මතු නොවන බවත් ඉවත් කරන ලද ඉහළ පස් අතුරා භූමිය පුනරුත්ථාපනය කිරීමෙන් පසු වගාවන් සඳහා හා වෙනත් සුදුසු කටයුතු සඳහා භූමිය භාවිත කළ හැකි" බවත් දැක්වෙන ප්‍රකාශනයක් ඇතුළත් කර තිබීම හේතුවෙන් භූමි පුනරුත්ථාපනය සඳහා බැංකු ඇපකර ලබාගෙන නොතිබුණි. තවද, කළුගල් කැණීම් සිදුකිරීමේදී පවත්නා පොළොව මට්ටමෙන් අභ්‍යන්තරයට කැණීම් සිදු නොකළ යුතු බවට බලපත්‍ර කොන්දේසි තුළ දක්වා තිබුණි. එසේ වුවද කළුගල් කැණීම් ස්ථාන බොහෝමයක් භූමි මට්ටමට වඩා පහතට කැණීම් කිරීමෙන් වලවල් සෑදී ඒවායේ වතුර පිරී තිබුණු අතර අනතුරුදායක ලෙස අතහැර දමා තිබුණි. කාර්යාංශය එම වලවල් පුනරුත්ථානය කරවීමට හා කැණීම් බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 12 වගන්තිය ප්‍රකාරව කාර්යාංශයේ කාර්යයක් වූ ශ්‍රී ලංකාවෙහි ක්‍රමවත් භූ විද්‍යා සිතියම් සැකසීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරය හා එහි කාර්යසාධනය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක සිතියම සම්පාදනය සහ මුද්‍රණය කිරීම 2022 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මුද්‍රණ කටයුතු අවසන් කර නොතිබුණි. | මේ වනවිට විල්පත්තු සිතියම් මුද්‍රණ කටයුතු අවසන් කර ඇත. | ක්‍රියාකාරී සැලසුම් අනුව නියමිත කාලය තුළ නිම කළ යුතුය. |
| (ii) 1:50,000 චාතුර්ථික සිතියම්කරණය යටතේ අංක 29 කල්පිටිය සිතියම මුද්‍රණය කිරීම 2022 අප්‍රේල් වන විට සහ විල්පත්තු කලාපයේ සිතියම 2023 වර්ෂයේ මැයි වන විට මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණද එම කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (iii) සමාලෝචිත වර්ෂයේ මාර්තු වන විට මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණු වවුනියා-ත්‍රිකුණාමලය අංක 6 පාංශු භූ රසායනික සිතියම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මුද්‍රණය කර නොතිබුණි. | -එම- | -එම- |
| (iv) උතුරු මැද පළාත් අංක 08 සිතියම සම්පාදනය සහ මුද්‍රණය සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද සම්පාදන කටයුතු පමණක් නිම කර තිබුණි. | . -එම- | -එම- |
| (ආ) 2021 හා 2022 වර්ෂ සඳහා වූ ඛනිජ අත්පොත් 2024 අප්‍රේල් 30 විගණිත දින වන විටත් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | වාර්ෂික ඛනිජ අත්පොත ප්‍රකාශයට කාර්යාංශය තුළ දත්ත මෙන්ම ඛනිජ සම්බන්ධ ව්‍යාපාරවල යෙදී සිටින්නන්ගෙන්ද වෙනත් රාජ්‍ය ආයතන වලින් ද දත්ත ලබාගනු ලැබේ. විවිධ ඛනිජ ද්‍රව්‍යවල නිෂ්පාදිත ප්‍රමාණය (Production) ආනයනය හෝ අපනයනය කළ ප්‍රමාණ පිලිබඳ දත්ත මේ අතර වේ. එහෙත් බොහෝ විට මෙම සමාගම් අදාල දත්ත නිසි වෙලාවට ලබා නොදීම මෙන්ම ශ්‍රී ලංකා රේගුව වැනි ආයතන එම දත්ත ලබාදීම සඳහා මුදල් අයකිරීමට තීරණය කිරීම හේතුවෙන් නිසි වේලාවට මෙම ඛනිජ අත්පොත එළිදැක්වීම බොහෝ විට සිදුකිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලසුම් තුළ සැලසුම් කළ කාර්යභාරයන් නියමිත පරිදි ඉටු කළ යුතුය. |
| (ඇ) 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට විගණන දින වූ 2024 ජූලි 16 දක්වා කටයුතු කර නොතිබුණි. | ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මේ වනවිට සකස් කර අනුමැතිය සඳහා පරිසර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | අමාත්‍ය මණ්ඩලය තීරණය අනුව කටයුතු කළ යුතුය. |